**තවලම ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**--------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 දෙසැම්බර් 01 දිනද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 පෙබරවාරි 27 දින සභාවේ ලේකම්වරයාට භාර දී ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**-----------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට තවලම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේ දී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් සහ ප්‍රාග්ධනය යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම් ශේෂ අතර රු.684,567 ක වෙනසක් පැවැතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ රු.24,585 ක් වූ කඩ කුලී සහ රු.179,860 ක් වූ ව්‍යාපාර බදු ආදායම් මෙන්ම සැපයුම් හා උපකරණ වියදම රු.78,770 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.56,888 ක් වූ සේවක ණය පොලිය, ණය ගිණුමේ බැරට සටහන් කිරීම නිසා ණය ශේෂය සමාන අගයෙන් අඩුවෙන් දැක්වුණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්
**---------------------------**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.54,587,339 ක් වූ ගිණුම් විෂයයන් 14 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර එකතුව රු.11,334,143 ක අසමානතා නිරීක්ෂණය විය.

### 1.3.3 අවිනිශ්චිත ගිණුම
**--------------------**

වර්ෂ 03 කටත් අධික කාලයක සිට නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.18,448 ක් වූ අවිනිශ්චිත ගිණුමේ හර ශේෂයට අදාළ ගැලපීම් කර ගිණුම් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

**1.3.4 ලැබිය යුතු ගිණුම්**

(i) ඉදිරියට ගෙනෙමින් පවතින රු.538,000 ක් වූ ලැබිය යුතු වෙළෙඳ සංකීර්ණ ඇප තැන්පත් ශේෂය සහ රු.8,800 ක් වූ හිඟහිටි වෙළෙඳ බලපත්‍ර ගාස්තු ශේෂය නිරවුල් කර නොතිබුණි.

(ii) සභා බලප්‍රදේශය තුළ ක්‍රියාත්මක කළ සංවර්ධන ව්‍යාපෘති සඳහා 2011 වර්ෂය වෙනුවෙන් රු.777,849 ක්, 2014 වර්ෂය සඳහා රු.3,406,400 ක් සහ 2015 වර්ෂය වෙනුවෙන් රු.5,000,000 ක්ද, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**1.3.5 ගෙවිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ අවසානයට කර්මාන්ත 20 ක් සඳහා ගෙවීමට තිබූ එකතුව රු.9,784,249 ක මුදලක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබූ අතර, ඉන් කර්මාන්ත 02 ක් සඳහා ගෙවිය යුතු රු.577,849 ක මුදල 2011 වර්ෂයටත් පෙර සිට ඉදිරියට ගෙනෙමින් පැවැතුණි.

**1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

එකතුව රු.29,074,508 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් යාවත්කාලීනව හා විධිමත්ව පවත්වන ලද ස්ථාවර වත්කම් ලේඛනයද, එකතුව රු.157,716 ක් වූ වෙනත් ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සම්බන්ධයෙන් ඉන්වෙන්ට්‍රි ලේඛනයද, එකතුව රු.2,258,021 ක් වූ මුද්දර ගාස්තු හා උසාවි දඩ වලට අදාළ ලේඛනද, රු.37,290 ක් වූ පුස්තකාල සාමාජික මුදල් ලැබීමේ ලේඛනයද යනාදී සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත විස්තර දැක්වෙන නීති, රීති සහ රෙගුලාසි විධිවිධාන වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 570 හා 571(1)(2) | කාලය ඉක්මවා තිබුණු එකතුව රු.827,787 ක් වූ තැන්පතු ශේෂ 22 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1645 සහ 1646 | සභාව සතු වාහන 07 කට අදාළ දෛනික ධාවන සටහන්පත් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| **(ආ)** | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 07 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා අඩු වූ ආදායම රු.3,990,442 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.1,129,676 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,120,118 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් බඳවාගෙන තිබුණු සේවකයින්ගේ වැටුප් හා දීමනා ගෙවීම සඳහා සභාවේ ආදායමින් රු.4,071,464 ක වියදම් දරා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන ආදායමට සාපේක්ෂව පුනරාවර්තන වියදම සියයට 124 ක තරම් ඉහළ අගයක් ගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ ආදායම් ආධාර, ස්වයං උත්පාදන ආදායම් සහ පුනරාවර්තන වියදම් පිළිබඳ සාරාංශගත විස්තරයක් පහත දැක්වේ.

| **වර්ෂය** | **මුළු පුනරාවර්තන ආදායම** | **ආදායම් ආධාර** | **ස්වයං උත්පාදන ආදායම** | **මුළු පුනරාවර්තන වියදම** | **ස්වයං උත්පාදන ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම** |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| 2015 | 16,817,179 | 12,644,127 | 4,173,052 | 20,807,621 | 16,634,569 |
| 2014 | 18,863,903 | 13,958,683 | 4,905,220 | 17,734,228 | 12,829,008 |
| 2013 | 11,887,489 | 7,459,564 | 4,427,925 | 11,507,780 | 7,079,855 |

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සභාවේ ආදායම් ආධාර සහ ස්වයං උත්පාදන ආදායම් පිළිවෙලින් රු.1,314,556 කින් හා රු.732,168 කින් පිරිහී ඇති බව පෙන්නුම් කෙරේ.

(ii) පුනරාවර්තන වියදම් අඛණ්ඩව වැඩිවන වේගයකින් සැලකියයුතු අගයන්ගෙන් වැඩි වී ඇති නමුත්, එම වියදම් පාලනය කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(iii) ඉකුත් වර්ෂයේදී සභාවේ ස්වයං උත්පාදන ආදායම මෙන් තුන් ගුණයක හා සමාලෝචිත වර්ෂයේදී සිව් ගුණයක ස්වයං උත්පාදන ආදායම් ඉක්ම වූ පුනරාවර්තන වියදම් පැවැති බව පෙන්නුම් කෙරුණි.

(iv) සමාලෝචිත වර්ෂයේදී මුළු පුනරාවර්තන ආදායම් ඉක්මවා රු.3,990,442 ක පුනරාවර්තන වියදම් පැවතුණි. ඉකුත් වර්ෂ දෙකේදීද ආදායම් ආධාර නොලැබෙන්නට කිසිදු ආකාරයකින් සභාවේ ආදායම්වලින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට නොහැකි තත්ත්වයක් පැවැති බව පෙන්නුම් කෙරේ.

(v) ඉහත අංක (i) සිට අංක (iv) දක්වා ඡේද වල දැක්වෙන කරුණු අනුව එම ආදායම් ඉහළ නංවා ගැනීමට සභාව විසින් අවධානය යොමු කළයුතුව ඇති බවත්, ඒ සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කළයුතු බවත්, එසේ නොමැති වුවහොත් දුර්වල මූල්‍ය කළමනාකරණය මත සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව ගැටළු සහගත තත්ත්වයන් උද්ගත වියහැකි බවත් විගණනයේ අදහසයි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ප්‍රාග්ධන ආදායම රු.11,528,037 ක් වුවද, තථ්‍ය ප්‍රාග්ධන වියදම රු.2,223,156 ක් වීමෙන් රු.9,304,881 ක ප්‍රාග්ධන ඉතිරියක් පැවැතුණි. එම මුදල් සභා බලප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා යොදවා නොගැනීම ජනතාවට සිදු වූ පාඩුවක් බව විගණනයට නිරීක්ෂණය විය.

## 2.3 ආදායම් පරිපාලනය

---------------------

### 2.3.1 අක්කර බදු

------------

හිඟ අක්කර බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට ඉකුත් වර්ෂ වෙනුවෙන් රු.43,885 ක හිඟ ශේෂයක් පැවැතුණි.

### 2.3.2 ව්‍යාපාර බදු

------------

හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ව්‍යාපාර බදු ශේෂය රු.160,050 ක් විය.

**2.3.3** **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.1,971,585 ක් හා උසාවි දඩ වෙනුවෙන් රු.286,436 ක් ලැබිය යුතුව තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **ව්‍යාපෘති ප්‍රමාද කිරීම**

පරිත්‍යාගයක් වශයෙන් ලැබී තිබුණු ඉඩමක කසල කළමනාකරණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා රු.913,423 ක වියදමින් මුර කුටියක් හා ව්‍යාපෘති කාර්යාලයක් ඉදිකර තිබුණි. මේ සම්බන්ධව සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අදාළ ගොඩනැගිලි විනාශ වී තිබූ අතර, ඇතැම් උපකරණ අස්ථානගත වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී අදාළ ව්‍යාපෘතිය සඳහා රු.39,700 ක මුදලක් සභා අරමුදලින් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතියට අදාළ ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු 2014 වර්ෂයේ නිමකර තිබූ නමුත්, 2016 දෙසැම්බර් 01 දින වනවිටත් කසල කළමනාකරණ ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර නොතිබුණි.

**3.2** **අවිධිමත් ගනුදෙනු**

ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xiv පරිච්ඡේදයට අනුකූල නොවී සභාවේ තාක්ෂණ නිලධාරීට හා ආදායම් පරීක්ෂකවරයෙකුට ගෙවිය යුතු පරිවර්තිත ගමන් වියදම් දීමනාව දෙගුණ කර ගෙවීම නිසා සමාලෝචිත වර්ෂයේදී රු.66,826 ක වැඩිපුර ගෙවීම් සිදු වී තිබුණි.

**3.3** **කොන්ත්‍රාත් පරිපාලනය**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) **හබරාකඩ බටහිර කපල්ල ඇල ඉහල පාර සංවර්ධනය කිරීම**

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන (වතු මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය) යටතේ හබරකඩ බටහිර කපල්ල ඇල ඉහල පාර පෙරසැරි ගල් අල්ලා සංවර්ධනය කිරීම සඳහා රු.1,951,190 ක වියදම් දරා තිබුණි.

(i) වැඩ විෂය අංක 06 යටතේ රු.1,582,460 ක් ගෙවා තිබුණද, සම්පීඩන තත්ත්ව වාර්තාව අනුව අවශ්‍ය සම්පීඩන තත්ත්වය නොතිබූ අතර, ඇතැම් පෙරසැරි වල චිප් ගල් මතු වී තිබුණි.

(ii) පෙරසැරි ගල් දෙපස කොන්ක්‍රීට් ගැටි බැම්ම (curbs) සඳහා රු.255,374 ක මුදලක් ගෙවා තිබූ නමුත්, කොන්ක්‍රීට් වල ගල් මතු වී ඇතැම් තැන් කැඩී ගොස් තිබුණි.

(ආ) **කිතුල් දොළ මාර්ගය සංවර්ධනය කිරීම**

**---------------------------------------**

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ තලංගල්ල කිතුල් දොළ මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා රු.475,876 ක වියදම් දරා තිබුණි. පරීක්ෂණය සඳහා නියැදි තුනක් ඉදිරිපත් කර තිබුණු නමුත්, ඉන් එක් නියැදියක හෝ අවශ්‍ය සම්පීඩන ශක්තිය නොතිබුණි. එහෙත් ඒ ගැන නොසලකා අතරැදි මුදල්ද ගෙවා තිබුණි.

(ඇ) **ආදාහනාගාරය**

-----------------

ආදාහනාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා රු.4,280,000 ක ඇස්තමේන්තුවකට 2012 ඔක්තෝබර් 25 දින ගිවිසුම්ගත වී තිබූ අතර, එම ඉදිකිරීම් කටයුතු අවසන් කර, 2013 ජනවාරි 07 දින පළාත් පාලන දෙපාර්තමේන්තුවට භාර දී තිබුණි. 2013 දෙසැම්බර් 06 දින ජනතා අයිතියට පත්කර තිබුණු ආදාහනාගාරයෙහි වසර 03 ක් ඉක්මවීමටත් පෙර පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ජනතා අයිතියට පත් කිරීමෙන් අනතුරුව හඳුනාගත් අඩුපාඩු සම්පූර්ණ කර දෙන ලෙස අවස්ථා කිහිපයකදී කොන්ත්‍රාත් සමාගමෙන් ඉල්ලීම් කර තිබූ නමුත්, එම අඩුපාඩු සම්පූර්ණ කර දීමට කටයුතු කර නොතිබුණි.

(ii) ගොඩනැගිල්ල වටා ඉදිකර ඇති පැති වහල සහ ගොඩනැගිල්ලේ බිත්ති අතරින් ජලය කාන්දුවීම නිසා වහල සඳහා යෙදූ දැව සහ ඉදිරිපස සෙවිලි කර තිබූ පොලි කාබනේට් වහල ද විනාශ වී තිබුණි.

(iii) ගොඩනැගිල්ලේ කොන්ක්‍රීට් තට්ටුව (slab) මතින් ජලය කාන්දුවීම නිසා බිත්ති තෙමී තිබූ අතර, ප්‍රධාන විදුලි පරිපථයද ක්‍රියා විරහිත වී තිබුණි.

**3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**----------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ) මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පුරප්පාඩු 11 ක් පැවති නමුත්, එම පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත්, පැවැති අතිරික්ත තනතුරු 03 ක් විධිමත් කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

**(ආ) සේවක ණය**

--------------

සභාවේ සේවය කළ සේවකයින් 11 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.93,087 ක්වූ ණයශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

## 4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---------------------------------------

### 4.1 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් දෙකක එකතුව රු.239,200 ක් වූ මුළු ප්‍රතිපාදනයද, වෙනත් වියදම් විෂයයන් 05 ක එකතුව රු.30,336,367 ක ඉතිරිවීම්ද, තවත් වියදම් විෂයයක රු.291,033 ක වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවූ වියදම්ද, ආදායම් විෂයයන් 06 ක එකතුව රු.25,118,834 ක් වූ ලභාකර නොගත් ඉලක්කගත ආදායම්ද පැවැතීම නිසා අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය කරනු ලැබේ.

### 4.2 අභ්‍යන්තර විගණනය

------------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස්ගේ (දකුණු පළාත) 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යහ/01/න.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

### 4.3 විගණන හා කළමනාකරණ කමිටු

----------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA/2009(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

### 4.4 වත්කම් කළමනාකරණය

-----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව විසින් භාවිතයට යොදාගන්නා වාහන 05 ක අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 756 ප්‍රකාර සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ 2016 දෙසැම්බර් 31 දින වනවිටත් පවත්වා නොතිබුණි.

### 4.5 බේරුම් නොකළ බැරකම්

-----------------------------

මූල්‍ය ප්‍රකාශන වල ඉදිරියට ගෙනෙමින් පවතින පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.1,885,813 ක් හිඟ දායක මුදල් ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් පියවර ගෙන නොතිබුණි.

### 4.6 නොවිසඳී ඇති විගණන ඡේද

--------------------------------

ඉකුත් වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාවේ 2.2.1 ඡේදයේ ''අ'' සිට ''ඒ ''දක්වා වූ ඡේද වලින් පෙන්වා දෙන ලද අඩුපාඩු නිවැරදි කිරීමට එකඟ වී තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් එකඟ වූ පරිදි කටයුතු කර නොතිබුණි.

**5.** **පද්ධති හා පාලන**

--------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පාලනය

(ඉ) මානව සම්පත් කළමනාකරණය

(ඊ) වාහන පාලනය